ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2011 ජූලි

Genaral Certificate of Education (Ord. Level) Examination, July 2011

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I , II**
**Business and Accounting Studies I , II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) **1 සිට 40** තෙක් ප්‍රශ්න වල දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරු වලින් **නිවරැදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.**

(iv) I හා II පිළිතුරු පත්‍ර එක් පත්‍රයක් වන සේ එකට අමුණා භාර දෙන්න.

---

01. ව්‍යාපාරයක් යන්නෙන් අදහස් කරන්නේ,
1. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ආයතනයකි.
2. ලාභ ලැබීමේ අරමුණින් සිදු කරනු ලබන ඕනෑම කටයුත්තකි.
3. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරනු ලබන ඕනෑම කටයුත්තකි.
4. යෙදවුමක් නිමවුමක් බවට පත් කරන ආයතනයකි.

02. පහත සඳහන් දෑ අතරින් අවශ්‍යතාවක් නොවන්නේ,
1. ආහාර 2. මහල් නිවාස 3. අධ්‍යාපනය 4. සෞඛ්‍යය

03. ප්‍රාථමික නිෂ්පාදනය වර්ගීකරණය කළ හැක්කේ,
1. ගැලපුම් හා පෙරළුම් ලෙස ය.
2. පතල් හා කැණීම්, ධීවර හා නිමවුම් ලෙස ය.
3. ඉදිකිරීම්, නිමවුම්, කෘෂි හා වන ලෙසය.
4. කෘෂි, වන, ධීවර, පතල් හා කැණීම් ලෙස ය.

04. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති දුර්වලතාවක් නොවන්නේ,
1. ද්විත්ව සමපාතය නොගැලපීම.
2. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගත හැකි වීම.
3. වටිනාකම මැනීමේ අපහසුතා
4. භාණ්ඩ කුඩා කොටස්වලට වෙන් කළ නොහැකිවීම.

05. බාහිර පරිසර සාධකයක් නොවන්නේ,
1. ආර්ථික පරිසරය 2. ප්‍රජා පරිසරය 3. ගනුදෙනුකරුවන් 4. තාක්ෂණික පරිසරය.

06. හවුල් ව්‍යාපාරයක් කෙරෙහි බල නොපාන පණත වනුයේ,
1. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පණත
2. 2007 අංක 7 දරණ සමාගම් පණත
3. 1972 අංක 05 දරණ සමුපකාර පණත
4. 1840 වංචා වැළැක්වීමේ ආඥා පණත

07. හවුල් ව්‍යාපාරයකට ප්‍රාග්ධනය යොදා එහෙත් කළමණාකාරණ කටයුතු වලට සහභාගි නොවන හවුල්කරු හඳුන්වනු ලබන්නේ,
1. සීමිත හවුලකරු ලෙස ය.
2. අක්‍රිය හවුල්කරු ලෙස ය.
3. ආරූඪ හවුල් කරු ලෙස ය.
4. නාමික හවුල්කරු ලෙස ය.

08. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත නොවන්නේ,
1. මානව සැලැස්ම 2. අලෙවි සැලැස්ම 3. මෙහෙයුම් සැළැස්ම 4. මූල්‍ය සැලැස්ම

09. නිෂ්පාදන පිරිවැය සමන්විත වන්නේ,
1. ප්‍රාථමික පිරිවැය හා වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය
2. පොදුකාර්ය පිරිවැය හා සෘජු ද්‍රව්‍ය ශ්‍රමය
3. ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය හා වෙනත් පිරිවැය
4. ප්‍රාථමික පිරිවැය හා සෘජු වෙනත්, වක්‍ර වෙනත්

10. රක්ෂණයක ලක්ෂණයක් වනුයේ,
1. අවදානම නිශ්චිත වීම
2. අමතර ප්‍රතිලාභ ලැබීම
3. හානිපූර්ණ මූලධර්මය බල නොපායි
4. රක්ෂණ ඔප්පුව පැවරිය හැකිය.

දෙවන පිටුව බලන්න


11. ක්‍රමවත් ගබඩාකරණයක් නොතිබීමෙන් ඇතිවන ප්‍රතිවිපාකයක් වන්නේ,
   1. ඉල්ලුම සැපයුම සමතුලිතව පවත්වාගෙන යාම
   2. නිෂ්පාදන ක්‍රියාවලිය අඩපණවීම.
   3. බෙදාහැරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව කරගෙන යා හැකිවීම.
   4. පිරිවැය පාලනයක් සිදුවීම.

12. වණික් බැංකුවකින් ඉටු නොකරන කාර්යය වන්නේ,
   1. කෙටිකාලීන මූල්‍යනය
   2. ජංගම ගිණුම් පවත්වාගෙන යාම
   3. කල්බදුකරණය හා කුලිපිට ගැනීම
   4. මූල්‍යමය උපදේශක සේවා සැපයීම

13. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලබන්නේ,
   1. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව
   2. ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් මහ භාණ්ඩාගාරය
   3. රජය වෙනුවෙන් වාණිජ බැංකු
   4. අයවැය හිගය පියවීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව

14. රක්‍ෂණ හිමිකම පිළිබිඹු කෙරෙන නිදසුනක් නොවන්නේ කුමක් ද?
   1. දේපල රක්‍ෂණයකදී එහි නිත්‍යානුකූල හිමිකරු රක්‍ෂණය කළ හැක.
   2. මෝටර් රථයක් එහි ගමන් ගන්නා මගින්ට රක්‍ෂණය කළ හැක.
   3. දෙමාපියන්ට තම දූ දරුවන් රක්‍ෂණය කළ හැක.
   4. ණයක් ලබා දුන් තැනැත්තෙකුට දෙන ලද ණය ප්‍රමාණය තෙක් ණය ගැතියාගේ ජීවිතය රක්‍ෂණය කළ හැක.

15. පහත සදහන් ඒවා අතුරින් රේඛණයක් නොවන්නේ,




16. පුද්ගලීකරණයේ ප්‍රධාන අරමුණ වන්නේ,
   1. ජාත්‍යන්තර ආයතන වල නිර්දේශ සමග එකග වීම
   2. අයවැය හිගය මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් ආදායම් එකතු කිරීම.
   3. රාජ්‍ය ව්‍යවසායකයාගේ අධික අලාභ හා අකාර්යක්‍ෂමතාව වැලැක්වීම.
   4. තීරණ ගැනීමේ බලය ආයතනයේ සේවකයන්ට පැවරීම.

17. පහත සදහන් බැංකු අතුරින් බලපත්‍රලාභී විශේෂිත බැංකුව තෝරන්න.
   1. ලංකා බැංකුව
   2. සී/ස ලංකා කොමර්ෂල් බැංකුව
   3. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
   4. සී/ස හොංකොං ෂැංහයි බැංකුව

18. හොඳ මුදලක ලක්‍ෂණයක් නොවන්නේ,
   1. පොදු පිළිගැනීමක් තිබීම.
   2. පහසුවෙන් හඳුනාගත හැකි වීම.
   3. කල් පසු ගෙවීම් ක්‍රමයක් වීම
   4. මුදලේ අගය උච්චාවචනය නොවිය යුතුය.

19. වෙළෙඳ පොලට ඉදිරිපත් කෙරෙන කිසියම් නිෂ්පාදිතයක් ඉලක්ක ගැනුම්කරුට වඩාත් සාර්ථකව අලෙවි කිරීමට නම්,
   1. ක්‍රය ශක්තිය ඇති මිලදී ගන්නාට එමගින් තෘප්තියක් ලැබිය යුතුය.
   2. මිලදී ගන්නාගේ ක්‍රය ශක්තිය ශක්තිමත් විය යුතුය.
   3. මිලදී ගන්නා පමණක් නොව කුටුම්භයේ අය ද කැමති විය යුතුය.
   4. එය නීති විරෝධී නොවන්නක් විය යුතුය.

20. ශ්‍රී ලංකාවේ ඇත්තේ කවර වර්ගයේ හවුල් ව්‍යාපාර ද?
   1. සීමාරහිත හවුල් ව්‍යාපාර හා සීමාසහිත හවුල් ව්‍යාපාර
   2. සීමාරහිත හවුල් ව්‍යාපාර හෙවත් සාමාන්‍ය හවුල් ව්‍යාපාර
   3. සීමාසහිත හවුල් ව්‍යාපාර හෙවත් සාමාන්‍ය හවුල් ව්‍යාපාර
   4. සීමාරහිත හවුල් ව්‍යාපාර හා ලේඛණගත හවුල් ව්‍යාපාර

21. ව්‍යාපාරයක පවතින වත්කම් වල ලක්‍ෂණයක් වන්නේ,
   1. අනාගතයේ දී ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයකට ලබා දීම.
   2. අතීත ගනුදෙනුවක් තුලින් බිහි වූ බැඳීමක් වීම.
   3. ව්‍යාපාරයේ පාලනයට යටත් නොවීම.
   4. එහි පිරිවැය විශ්වාසනාවයකින් මැනිය නොහැකි වීම.

තුන්වන පිටුව බලන්න

22. අයිරා පහසුකම හා බැංකු ණය අතර ඇති ප්‍රධාන වෙනස වන්නේ,
   1. අයිරා කෙටිකාලීන වන අතර බැංකු ණය දිගුකාලීන වේ.
   2. බැංකු ණය ජංගම ගිණුම්හිමියන්ට පමණක් ලබා දීම.
   3. අයිර දිගුකාලීන වන අතර බැංකු ණය කෙටිකාලීන වේ.
   4. බැංකු ණය කෙටිකාලීන වගකීමක් වන අතර බැංකු අයිරා දිගුකාලීන වගකීමක් වේ.

23. පහත සමීකරණ වලින් වඩාත් නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,
   1. වත්කම් + බැංකුණය = ප්‍රාග්ධනය + වගකීම්
   2. ජංගම නොවන වත්කම් + ජංගම නොවන වගකීම් = ප්‍රාග්ධනය + ජංගම වත්කම් + ජංගම වගකීම්
   3. වත්කම් + වියදම් = ප්‍රාග්ධනය + ආදායම් + වගකීම්
   4. ජංගම නොවන වත්කම් + ජංගම වත්කම් = ප්‍රාග්ධනය - අමතර ප්‍රාග්ධනය + ජංගම වගකීම්

24. ණයගැති ශේෂයක් ඊට සමාන ණයහිමි ශේෂයකට හිලව් කළ විට එහි ප්‍රතිඵලය ලෙස ශුද්ධ ජංගම වත්කම් නොවේ.
   1. වැඩි වේ. 2. අඩුවේ. 3. වෙනසක් නොවේ. 4. මේ කිසිවක්

25. පහත දැක්වෙන ඒවා අතුරින් ව්‍යාපාරයක වියදම් වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ,
   1. පරිගණයක් මිලට ගැනීම. 2. ණයහිමියකුට ගෙවීම.
   3. වැටුප් ගෙවීම 4. බැංකු ණය ගෙවීම.

26. මුදල් පොතේ බැංකු තීරුවේ බැංකු අයිරාවක් පෙන්නුම් කරද්දී බැංකු ප්‍රකාශයේ වාසිදායක ශේෂයක් තිබිය හැකි වනුයේ,
   1. උපලබ්ධි නොවූ තැන්පතු 2. ඉදිරිපත් නොකල චෙක්පත්
   3. ස්ථාවර නියෝග 4. බැංකු ගාස්තු

27. එක්තරා මාසයක් සඳහා එම මාසයේ මුදල් පොතේ (බැංකු තීරුව) සහ බැංකු ප්‍රකාශය එම මාසය අවසානයේ දී සංසන්දනය කිරීමෙන් හඳුනාගත නොහැකි අයිතමය වන්නේ,
   1. රු. 1,000 ක බැංකු ගාස්තු
   2. මුදල් පොතේ රු. 700 ක් ලෙස සටහන් වී ඇති රු. 7,000 උපලබ්ධි නොවූ තැන්පතුවක්.
   3. බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පතක්
   4. මුදල් පොතේ රු. 300 ක් ලෙස සටහන් කර ඇති (දැනටමත් උපලබ්ධි වී ඇති) රු. 3,000 ක තැන්පතුවක්.

28. පොදුකාර්ය පිරිවැය සමන්විත වන්නේ,
   1. නිෂ්පාදනයට අදාල සියලුම වියදම් ය. 2. සියලුම වක්‍ර පිරිවැය වලිනි
   3. සියලුම විචල්‍ය පිරිවැය වලිනි. 4. ප්‍රාථමික පිරිවැයෙනි.

29. මුදල් වට්ටම් සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,
   1. මුදල් වට්ටම් පිරිනමනු ලබන්නේ ලැයිස්තුගත මිලට වඩා ඉන්වොයිස් මිල අඩු කිරීමේ දී ය.
   2. මුදල් වට්ටම් පිරිනමනු ලබන්නේ ණයගැතියන් මුදල් ගෙවීමට පෙළඹවීම සඳහා ය.
   3. මුදල් වට්ටම් ගිණුම්කරණයේදී නොසලකා හරිනු ලැබේ.
   4. ඉහත සඳහන් ඒවායින් කිසිවක් නොවේ.

30. තනි වෙළෙන්දෙකුගේ එක් ගනුදෙනුවකින් එම ව්‍යාපාරයේ මුළු වත්කම් සහ මුළු වගකීම් රු. 150,000 කින් වැඩි වුණි. මෙම ගනුදෙනුව විය හැක්කේ,
   1. බැංකු වාරික ලෙසින් වසර තුලදී රු. 150,000 ක් ගෙවීම.
   2. වෙළෙඳ ණයගැතියකුගෙන් රු. 150,000 ක් අයකර ගැනීම.
   3. හිමිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට රු. 150,000ක් මුදලින් ලබා ගැනීම.
   4. රු. 150,000ක යන්ත්‍රයක් ණය පදනම මත මිලදී ගැනීම.

31. ඉදිරි කාල සීමාවක කරනු ලබන විකුණුම් වෙනුවෙන් ගනුදෙනුකරුවෙකුගෙන් අත්තිකාරම් මුදලක් ලැබීම සටහන් කල යුත්තේ,
   1. වත්කමක් ලෙස ය. 2. වගකීමක් ලෙස ය. 3. වියදමක් ලෙස ය. 4. ආදායමක් ලෙස ය.

32. ව්‍යාපාරයක් විසින් 5% ක වෙළෙඳ වට්ටමකට යටත් ව රු. 300,000 ක් වටිනා භාණ්ඩ ණයට ගන්නා ලදි. පසුව ණය පියවීමේ දී 10% ක මුදල් වට්ටමක් ව්‍යාපාරයකට ලැබුණි. මෙම ගනුදෙනුව ගැනුම් ගිණුමේ සටහන් කරන අගය වනුයේ,
   1. රු. 255,000 2. රු. 256,500 3. රු. 285,000 4. රු. 300,000

33. සුළු මුදල් අග්‍රිමය රු. 1200 කි. මාසය තුළ වියදම් කළ ප්‍රමාණය රු. 1,110 කි. අග්‍රිමය ප්‍රතිපූරණයට අවශ්‍ය මුදල කීයද?
   1. රු. 90 2. රු. 1,200 3. රු 1,290 4. රු. 1,110

හතරවන පිටුව බලන්න

34. පැන් ට්‍රේඩර්ස් විසින් ගොඩනැගිල්ලක කාර්යාල ඉඩකඩ රු. 10,000 ක මාසික කුලියට ලබාගෙන ඇත. ආරම්භයේ දී රු. 50,000 ක ආපසු ගෙවීමේ තැන්පතුවක් ගෙන ඇත. මෙහි වටිනාකම රු. 1,000,000 කි.
ඉහත කරුණු ගිණුම්කරණ සමීකරණයට බලපානුයේ,

| | ප්‍රාග්ධනය | + වගකීම් | = | වත්කම් |
|---|---|---|---|---|
| 1. | - 10,000 | | = | + 50,000<br>- 50,000<br>- 10,000 |
| 2. | | | = | + 50,000<br>- 50,000 |
| 3. | - 50,000 | + 1,000,000 | = | - 1,000,000<br>- 50,000 |
| 4. | - 50,000 | | = | - 50,000 |

35. ගැණුම් ජ්නලයේ එකතුව මාරු කරනුයේ,
1. ගැණුම් ගිණුමේ බැරට ය.
2. දෛනික ගැණුම් පොතේ හරට ය.
3. ණයහිමි පාලන ගිණුමේ හරට ය.
4. ගැණුම් ගිණුමේ හරට ය.

36. අනිල් සමාගම විසින් නිකුත් කරන ලද බැර පත මුලින් සටහන් කරනුයේ,
1. විකුණුම් ගිණුමේ ය.
2. ආපසු එවුම් ගිණුමේ ය.
3. ආපසු එවුම් ජ්නලයේ ය.
4. ආපසු යැවුම් ජ්නලයේ ය.

37. P, Q, R යන ව්‍යාපාර වල මූල්‍ය තත්වය පිලිවෙලින් A, B, C වශයෙන් සදහන් කර ඇති තැන් වල වටිනාකමක් නොමැතිව පහත දක්වා ඇත.

| | ප්‍රාග්ධනය | වත්කම් | වගකීම් |
|---|---|---|---|
| P | A | 350,000 | 300,000 |
| Q | 25,000 | B | 150,000 |
| R | 60,000 | 100,000 | C |

A, B, C වශයෙන් සදහන් කර ඇති තැන්වල පිළිවෙලින් තිබිය යුතු අගයන් වන්නේ,
1. A = රු. 650,000 B = රු. 125,000 C = රු. 160,000
2. A = රු. 50,000 B = රු. 175,000 C = රු. 40,000
3. A = රු. 650,000 B = රු. 175,000 C = රු. 40,000
4. A = රු. 50,000 B = රු. 125,000 C = රු. 40,000

38.

| | | රු | රු |
|---|---|---|---|
| ගෙවිය යුතු (ණයහිමි) | හර | 10,000 | |
| ලැබිය යුතු ණය ගිණුම (ණයගැති) | | | 10,000 |

ඉහත සදහන් ජ්නල් සටහන යෙදීමට හේතුව වන්නේ,
1. රු. 10,000 බැගින් වටිනාකම් ඇති ණයහිමියෙකු හා ණයගැතියකු බුන්වත් වීම.
2. අඩමාණ ණය සදහා වූ රු. 10,000 අඩි ප්‍රතිපාදනය ප්‍රතිවර්ත (Reversal) කිරීම.
3. සැපයුම්කරුවන් හා ගනුදෙනුකරුවන් අතර රු. 10,000 බැගින් වූ ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම් එකිනෙක හිලව් කිරීම.
4. රු. 10,000 බැගින් වූ ණය හිමියන්ට මුදල් ගෙවීම් හා ණයගැතියන්ගෙන් මුදල් ලැබීම.

39. එක්තරා වෙළෙන්දෙක් ගත්මිලට 10% ක් ලාභ තබා ගෙන භාණ්ඩයක් රු. 7,920ට විකුනනු ලබයි. ඔහු එම භාණ්ඩයෙන් ලැබූ ලාභය කියද ?
1. රු. 792
2. රු. 720
3. රු. 7,200
4. රු. 6,480

40. සාර්ධා තම ඉතිරිකර ගත් කිසියම් මුදල් ප්‍රමාණයක් එක්තරා සමාගමක කොටස් මිලදී ගැනීම සදහා ආයෝජනය කලේ ය. වර්ෂ අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩලය 15% ලාභාංශයක් ඇයට ලබා දුන්හ. එම ලාභාංශ මුදල් සමග රු. 138,000 ක් නැවත එම සමාගමෙන් කොටස් මුදල් සමග ලබා ගෙන එම සමාගෙමෙන් ඉවත් විය. සාර්ධා රු. 138,000 ක මුදලක් ලබා ගැනීමට ආයෝජනය කළ මුදල කියද?
1. රු. 140,700
2. රු. 20,700
3. රු. 120,000
4. රු. 117,300

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර